**එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව**

**--------------------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 01 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මතය

------

මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට එරාවූර්පත්තු පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 1.3.1 ලැබිය යුතු ගිණුම්

------------------

ස්ථාන මාරුවීම් ලබා ගිය සහ තනතුරෙන් අස් වූ සේවකයන් 07 දෙනෙකුට ප්‍රාදේශීය සභාවෙන් දෙන ලද ණය පහසුකම්වල හිග මුදල වූ රු.821,070 ක් අවුරුදු 3 සිට 14 ක් දක්වා වූ කාලයක් තිස්සේ අය කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් සභාව අවශ්‍ය කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබුණි.

#### 1.3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති සහ අණපනත්වලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | (i) 1 පරිච්ඡේදය 5 (12) රීති | මුදල් සහ ගබඩා වගකීම්, රාජකාරි මට්ටමෙන් නිලධාරීන් සතර දෙනෙකුට භාරදී ඇතත් එම අයගෙන් සුරැකුම් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | X පරිච්ඡේදයේ 193 රීති | සමාලෝචිත වර්ෂයේදී ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් විස්තර අයවැය ලේඛනය සමඟ සැසඳීම් කර විෂමතාවලට අදාල කරුණු ඇතුලත් කොට සකස් කළ වාර්තාවක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2006 යේ 2010 දෙසැම්බර් 06 දිනැති ප්‍රසම්පාදන සැලැස්ම පසු ඇමුණුම් 19 - වගන්තිය 9.3 | රු.200,000 ඉක්මවා යන වාහන අලුත්වැඩියා වියදම් සඳහ අමාත්‍යාංශයේ ලේකම්වරායගෙන් අනුමැතිය ලබාගත යුතුව තිබියදී සමාලෝචිත වර්ෂයේදී වාහන අලුත්වැඩියාව සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය නොමැතිව රු.347,500 ක් වියදම් කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 571 දරන මුදල් රෙගුලාසිය | අවුරුදු දෙකක් ඉක්මවා කල්ගත වූ තැන්පතු රු.4,063,644 ක මුදල සම්බන්ධයෙන් මුදල් රෙගුලාසියේ ඇති විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සභාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.30,764, 081 කි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 16,949,222 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු 13,814,859 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 2.2 ආදායම් කළමනාකරණය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ශේෂය

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම, ආදායම් හිගය යනාදි තොරතුරු පහත දැක්වෙන පරිදිය.

| ආදායම් වර්ගය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ශේෂය |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| වරිපනම් සහ බදු | 4,853,184 | 6,065,090 | 3,422,122 |
| බලපත්‍ර ගාස්තු | 1,705,250 | 1,705,250 | 103,700 |
| විනෝද බදු | 365,797 | 103,902 | 671,282 |

### 2.2.2 සන්නිවේදන කුළුණු හිමිකම්

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතේ 126 වන වගන්තිය පරිදි සභාව විසින් ආදායම් අය කර ගැනීමට උප වගන්ති නීතිගත කර ගැනීමට නොහැකි වූ නිසා සභාවේ සීමා බල ප්‍රදේශයට ඇතුළත් ස්ථානවල පුද්ගලික සන්නිවේදන ආයතන මගින් ඉදි කරනු ලැබූ සන්නිවේදන කුළුණු 14 ක් සඳහා වූ ගාස්තු අය කර ගැනීමට නොහැකි වූ නිසා සභාවට 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. 177,000 ක ආදායමක් අහිමි විය.

**2.2 3** **වරිපනම් සහ බදු**

**--------------------**

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතේ 134 වන වගන්තිය පරිදි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාවට ඇතුළත් ඉඩම් සහ ඉදි කරන ලද නිවාස ගොඩනැගිලි යනාදිය සඳහා වරිපනම් ගාස්තු අය කිරීමට සභාව අවශ්‍ය කටයුතු නොකළ බැවින් ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වන මෙම වරිපනම් ගාස්තු මගින් ලැබිය යුතු රු.430,000 ක් පමණ වාර්ෂික ආදායමක් සභාව අහිමි වී තිබුණි.

**2.2. 4** **වෙළෙඳ සැල් ගාස්තු සහ අනෙකුත්**

**---------------------------------------**

අවුරුදු 05 කට වඩා හිගව පවතින වෙළෙඳ සැල් ගාස්තු, මස් කඩ ගාස්තු , අලෙවි සැල් ගාස්තු වශයෙන් රු.3,334, 854 ක මුදලක් අදාල පුද්ගලයන්ගෙන් අය කර ගැනීමට නැතහොත් එම අයට විරුද්ධව නීත්‍යානුකූල ක්‍රියා මාර්ගයක් ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා සභාව අසමත් වී තිබුණි.

**3.** **යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය**

**-----------------------------------------**

**අයවැය පාලනය**

**------------------**

අය වැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 30% සිට 105% දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.** **පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) අයවැය පාලනය